# මෙත් සිතින් ලියමි,

සත්වයාගේ මනස එන්න එන්නම දුසිරිතෙහි ඇලෙමින් පවතී. මිත්‍යා දෘෂ්ටිය නම් වූ අන්ධකාරයෙන් මුලු ලෝකයම වැසීගෙන යන මොහොතකි. දිනෙන් දින අසන්නට දකින්නට ලැබෙන දේවල් තුල ඒ බව හොඳින්ම පැහැදිලි වේ. තවකෙකුගේ ජීවිතය තම ජීවිතය හා සමකොට දැකිය යුතුය. ඒ කෙසේද  මා ජීවත් වීමට කැමති සේම අන්‍යයෝද තම ජීවිතයට කැමති අය වෙති. එහෙත් දිනෙන් දිනම ලෝකයාගේ පිරිහීමේ ලකුණු පෙන්වමින් ජීවිත හානි කිරීම්, සොරකම්, මංකොල්ලකෑම්, ආදී නොයෙකුත් දේ පිළිබඳව උදෑසන සිට රාත්‍රී නින්දට යන තුරාවටම අසන්නට දකින්නට ලැබේ. මුළු ලෝකයම මාරයාගේ වසඟයට යමින් පවතී.

දිනක් මා දුටුවා එක්තරා රටක තරුණියක් ඩොලර් 10ක් සොරකම් කළ වරදට මහා පිරිසක් එක්ව ඇයට පහර දී නොයෙකුත් වදයන්ට පමුණුවා අවසන දෙනෝ දහක් දෙනා සිටි තැනම ඇයව පණ පිටින් ගිනි තබා මරණයට පත් කළා. සිතන්න මෙලොව මිනිසුන් කොතරම් පිරිහී ගොසින්ද? ඔවුන්ට ඩොලර් 10 තරම් වත් ජීවිතයක වටිනාකමක් තිබුනේම නැත. තිරිසන්ගත සත්වයින්ටත් වඩා අන්ත ස්වභාවයකට ඔවුන්ගේ මනස පත්ව තිබේ. එමෙන්ම ඇතැම් රටවල මිනිසුන්ව බෙල්ල තෙක් පොළොවෙහි වළලා පස් දමා වසා ඔවුන්ගේ හිස කුඩුවන්නට ගල් ගසා ජීවිත්ක්ෂයට පත්කරයි. ඔවුන් මෘගයින්ටත් වඩා අන්ත නොවේද?

එසේ මිය යන ඔවුන් හට කුමන පිහිටක් සරණක්ද? ඒ ඔවුන් මිත්‍යා දෘශ්ටිකව සිටියවුන් නිසාවෙනි. ජීවිතයේ කවමදාකවත් තෙරුවන් ගැන වත් අසා නැත්තෝය. සසර කෙතරම් බිය ජනකද? මිත්‍යා දෘෂ්ටිය තුල සිට මියෙන පුද්ගලයා නැවත මිනිස් ලොව හෝ සුගතියක උපත ලැබීම නම් අතිශය දුර්ලභ වූ කාරණාවකි. ඒ අතර ඔබත් මාත් බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇසෙන, නිති තෙරුවන් පිළිබඳ ඇසෙන, දන් පින් කරන, මහා පුණ්‍යකර්ම සිදුකෙරෙන මේ රටෙහි උපත ලැබීම කෙතරම් භාග්‍යක්ද? එහි උපරිම ඵල ප්‍රයෝජන ගැනීම ඔබ මා සතුය.

නමුත් අතීතයේ පැවති සාර ගුණදම් මෙහිද වියැකෙමින් පවතින බව හොඳින් පෙනී යයි. මේ උදවියද දැන් දැන් ගමන් කරමින් සිටින්නේ පෙර කී අගාදයටමය. රාත්‍රියේ ආලෝකයක් දැල්වූ විට ඒ වටා රැස්වන කෘමි සතුන් ඒ ආලෝකය තුල කුමක්දෝ සොයමින් ඒ මත්තෙහිම නැසෙන්නෝය. ඒ වගේම දැන් අප සමාජයද රූප පෙට්ටිවල නටනා රූකඩ දෙස බලමින්, ඒවාම සොයමින්, ඒවා ගැනම කතා කරමින්, ඒවා ගැනම සිතමින් මුලාවෙන්ම කල් ගෙවති.

මිනිස් ලොවක උපත ලැබීම කෙතරම් දුර්ලභ දෙයක්ද, ධර්මශ්‍රවනය කෙතරම් දුර්ලභ දෙයක්ද යන්න භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දී ඇත. ඔබගේ මෙන්ම මාගේ ජීවිතයද අවසන් වීමට ඇත්තේ තව තත්පර කිහිපයක් විය හැකිය. ඒ පිළිබඳව බුදු කෙනෙකුට හැර ඔබට, මට හෝ කිසිවෙකුට කිව නොහැක. ඒ මරණය තව මොහොතකින් සිදුවුවහොත්? ඔබ හා මා මේ ජීවිතයේ වැඩිපුරම සිදුකරගෙන ඇත්තේ පින්ද? පව්ද? එසේත් නැතිනම් කිසිවක් නැතිද යන්න අප අපේ චිත්තාභ්‍යන්තරයෙන්ම විමසා බැලිය යුතුය. ඊළඟ ආත්මය ගවයෙක්, බල්ලෙක්, බළලෙක්, කූඹියෙක්, කැරපොත්තෙක්, ගෙම්බෙක්, හාවෙක්, වේයෙක්, මාලුවෙක්, කුරුල්ලෙක් වෙලා ජීවත් වීමට සිදුවිය හැක. නිරයේ අනේක අපා දුක් විඳීමට සිදුවිය හැක. ප්‍රේත ලෝකයේ නොයෙක් දුක් පීඩා විඳීමට සිදුවිය හැක.

සසර කෙතරම් බිය ජනක දෙයක්ද යන්න නුවණින් යුතුව තෙරුම් ගන්න උත්සහ කරන්න. නොපමාව ධර්මයෙහි හැසිරෙන්න, කුසලයම වඩන්න, මෙසා දුර්ලභ වූ මනුෂ්‍ය ජීවිතයක් ලබා හිස් අතින්ම මිය යන්නේද යන්න ගැන ඔබම සිහියෙන් යුතුව සිතා බලන්න. වීර්යම වර්ධනය කරන්න. කුමක් පිණිසද? දුකින් තොරවූ යමක් වේද ඒ අමා නිවන් සුව ලැබීම පිණිසය. සසර දුකම වටහා ගන්න. මේ ජීවිතයේදී නොහැකි වුවහොත් ඔබට මට නැවත කල්ප ගාණකට විය සිදුරකින් වත් අහස බැලීමට නොහැකිවනු ඇත. නිවන පිණිස අප්‍රමාදීව කටයුතු කරන්න. තෙරුවන් සරණයි!!!

ඩී.එම්.එස්.එස්. දසනායක.